# 10 නරියාගේ වලිගය සුදුපාට වුණු හැටි

කැලෑවක දුඹුරු පාට නරියෙක් හිටියා. ඒ වුණාට උගේ වලිගය විතරක් සුදු පාටවෙලා. එහෙම වුණේ කොහොමද කියල දැනගන්න ඔයාලා ආසා ඇති නේ ද?

එක රටක ආච්චි කෙනෙක් හිටියා. ඒ ආච්චි ඌරන් හා කිකිළියන් ඇති කළා. වයස වැඩි නිසා ඇය හිතුවා මේ සතුන් බලා ගන්න කාට හරි බාර දෙන්න ඕන කියලා.

ඒ ආච්චි එක මිනිහෙකු ළඟට ගිහින් කිව්වා, මට මේ සතුන් ටික රකබලා දෙන්න කියලා. එයාට වැඩ තියනවා කියලා කැමති වුණේ නෑ.

ඊට පස්සේ ඒ ආච්චි, සතෙකුටවත් මේ වැඩේ බාර දෙනවා සිතාගෙන වලහෙකු හොයාගෙන ගියා. වලහාත් ඌරන්, කුකුළන් කෑමට ගන්න කෙනෙක්. ඌත් බොහොම ආසාවෙන් ඒ වැඩේ බාර ගත්තා. ඒත් එයාගෙ "ගර්ර්ර්....." සද්දෙ ආච්චිට ඇහුණාම ආච්චි හිතුවා අනේ මගෙ සත්තු ටික ඒ හඬට බයවෙයි කියලා, ආපහු යන්න ගියා.



ඔය විදියට වෘකයා, කොටියා වගේ කිහිප දෙනකු ළඟට ම ආච්චි ගියත් හරි ගියේ නැහැ. අන්තිමට ගියේ නරියා ළඟට. නරියා බොහොම කපටි සතෙක් නේ. ඌ කිව්වා මම ඒ සත්තුන්ට "මගෙ පුංචි දරුවනේ" කියලා කතා කරන්නම් කියලා. ආච්චි එයාට කැමති වෙලා පැටව් ටික නරියාට බාර දුන්නා බලා ගන්න.

ඔහොම යන අතරෙ දවසක් ආච්චි බලනකොට කූඩුවෙ හිටපු කළු ඌරු පැටවෙකුයි කුකුළු පැටවෙකුයි අඩු වෙලා. නරියාගෙන් අහපුවා ම නරියා කිව්වා. ඒ අය ඇවිදින්න ගිහින් දැන් ළඟ එනවා ඇති කියලා. ඒත් ඒ පැටව් දෙන්නා ආපහු ආවේ නෑ.

තව දවසක් ආච්චි බොන්න උණු කරපු කිරි වීදුරුවත් අතේ තියාගෙන කුඩුව පැත්තට ගියා. යනකොට කිකිළියො ටික “කොක්, කොක්, කොකෝක්....” කියලා කෑ ගහනවා; කුඩුව ඇතුළෙ ඉගිළෙනවා; උන් හොඳට ම බයවෙලා.



ආච්චි ඉක්මනින් දුවලා බලනකොට නරියා කිකිළියකුත් ඩැහැගෙන එළියට බහිනවා දැක්කා. ආච්චිට කේන්ති ඇවිත් කිරි කෝප්පෙන් නරියාට දමලා ගැහුවා. කිරි ටික වැදුණෙ නරියාගෙ වල්ගෙට. නරියා පස්ස නොබලා කැලේට ම දුවගෙන ගියා.

ඌ හැරිලා වලිගෙ දිහා බැලුවා. කිරි හැලිලා වලිගෙ සුදු වෙලා. එද ඉඳලා ඒ නරියාගේ වලිගය සුදු පාටයි.

මොනවා හරි පරිස්සම් කරන්න කෙනෙකුට දීපුවහම ඒක පරිස්සම් වුණේ නැත්නම් “නරියාට කුකුල්ලු බාර දුන්නා වගේ” කියලා කියමනකුත් අපි අතර තියෙනව.

## ක්‍රියාකාරකම : 1

i. මෙම කතන්දරය නිහඬ ව කියවන්න.

ii. ඔබට නුහුරු යෙදුම්වල අදහස වටහාගෙන ශබ්ද නගා කියවන්න.

iii. අසන්නන්ට අවබෝධ වන ලෙස සුදුසු පරිදි වචන උච්චාරණය කරමින් කියවන්න.

iv. තවත් මිතුරකු/මිතුරියක හා එක් ව ඡේදයෙන් ඡේදය මාරුවෙන් මාරුවට කියවන්න.

v. ඔබට වඩාත් ම රසවත් අවස්ථාව තෝරා කියවන්න.

## ක්‍රියාකාරකම : 2

පාඩම කියවා වඩාත් ගැළපෙන පිළිතුර තෝරා කියන්න.

I. මේ පාඩමේ සඳහන් නරියා මොන පාට ද?
   - i. සුදු පාටයි
   - ii. දුඹුරු පාටයි
   - iii. කළු පාටයි

II. ආච්චි ඇති කළ සතුන් වුණේ,
   - i. වලසුන් හා කුකුළන්
   - ii. ඌරන් හා වලසුන්
   - iii. ඌරන් හා කිකිළියන්

III. ආච්චි සතුන් බලාගන්න දෙන්න මුලින් ම ගියේ කා ළඟට ද?
   - i. වෘකයා ළඟට
   - ii. වලහා ළඟට
   - iii. නරියා ළඟට

IV. වලහා කෑ ගැසුවේ මොන හඬකින් ද?
   - i. ගර්ර්............
   - ii. කොක්, කොක්, කොකෝක්
   - iii. වච්! වච්! වච්!

V. නරියා සතුන්ට කතා කරනවා කීවේ කොහොම ද?
   - i. කොක්, කොක් කියලා
   - ii. මගේ පුංචි දරුවනේ කියලා
   - iii. ගර්ර්, කියලා

## ක්‍රියාකාරකම : 3

අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු කියන්න.

1. දවසක් ආච්චි කූඩුව ළඟට යනකොට අඩුවෙලා හිටියේ කුමන සතුන් ද?
2. සතුන් අඩු වීම ගැන නරියා දුන් පිළිතුර කුමක් ද?
3. ආච්චි උණු කිරි කෝප්පය රැගෙන කූඩුව ළඟට යන විට දුටුවේ කුමක් ද?

4. කේන්ති ගිය ආච්චි කළේ කුමක් ද?
5. නරියාගෙ වල්ගය කෙළවර සුදුපාට වුණේ කොහොමද?
6. මේ කතාවෙන් ඔබ වටහාගත්තේ කුමක් ද?
7. "නරියාට කුකුල්ලු බාර දුන්නා වගේ " කියලා කියන්නේ කුමන අවස්ථාවකදී ද?

## ක්‍රියාකාරකම :4

මෙවැනි කතා තවත් සොයාගෙන කියවන්න. ඒ ඇසුරෙන් පහත දැක්වෙන සටහන පුරවන්න.

| | කියවූ කතාවේ නම | ලබාගත් පණිවුඩය |
|---|---|---|
| i. | | |
| ii. | | |
| iii. | | |
| iv. | | |
| v. | | |